# රැස් වෙහෙර රජ මහා විහාරය

ජනක වෙත්තසිංහ



විහාරස්ථානයේ ප්‍රධාන පිළිම ගේ - ‘මහ රජ විහාරය’


සිත්තරකුගේ තෙලි තුඩට, ඡායාරූප ශිල්පියකුගේ කැමරා කාචයට අපූරු වූ සිත්තම් මැවිය හැකි නෙක දිසා පුරා විහිදුණු සොඳුරු පාරිසරික පද්ධතියක් හා මිතුරු වූ ලෙන් විශාල සංඛ්‍යාවක් පොකුණු ගල් පඩි ගල් කණු මෙන්ම නටබුන් ආදියෙන් පිරි ඓතිහාසික පුද බිමෙකි, සැස්සේරුව නැතිනම් රැස්වෙහෙර රජ මහා විහාරය. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රදේශයේ ඇහැටුවැව ග්‍රාමය ආසන්නයේ මෙම පුද බිම පිහිටා තිබේ. ගල්ගමුව නගර මධ්‍යයේ හොරගොල්ලාගම පාරේ ඇවිත් මීගලෑව පාරේ තවත් කි. මී. 16 ක් පමණ ගිය තැනදී රැස් වෙහෙරට ළඟා විය හැකිය.

කුරුණෑගල දඹුළු මගෙහි ඉබ්බාගමුව හරහා කුඹුක්ගැටය – පොල්පිතිගම පසුකර මොරගොල්ලාගමින් ද මේ පුද බිමට පිවිසිය හැක. තවත් යා හැකි මාර්ග ඒ අතර වේ. පාදම ඉමේ ඇති පතන වැවට මෙපිටින් කුඩා චෛත්‍යයක් දිස්වෙයි. ඉන් ඉහැත්තෑවේ වට වූ විසල් කඳු පන්තියක් මධ්‍යයේ මෙම රැස් වෙහෙර රජ මහා විහාරය ගොඩ නැංවී තිබේ. පෙර දවස යෝගාවචර භික්ෂූන් වහන්සේ වැඩ වාසය කළ ආරණ්‍ය සේනාසනයක් බවට සාධක හමුවේ. මෙහි ඇති විශේෂය වන්නේ ගල් පඩි පෙළ නැග ගිය පසු මැද තැනි බිමෙක අගින් නැවත නැග එන කඳු ගැටයක බිත්තියක් මත නෙළා ඇති විසල් හිටිවන බුදු පිළිම වහන්සේය.

මෙම පිළිම වහන්සේගේ උස අඩි 39 යි අඟල් 3 ක් බව තැනෙක සඳහන් වෙතත් විහාරවාසී ගලේවෙල සුගතානන්ද හිමියන් පවසන්නේ එය අඩි 42 යි අඟල් 4 ක් උස බවෙකි. එසේ උස පිළිබඳ පරස්පරතා ඇතත් මෙම පිළිමය ප්‍රකට අව්කන පිළිමයට වඩා අඟල් 5 කින් පමණ උස බව කියති. ගාන්ධාර සම්ප්‍රදායේ අභය මුද්‍රාව පිළිබිඹු කරන පිළිම වහන්සේගේ මුව වෘත්තාකාර නොවේ.

චීවරය සිරුරට ඇලී ඇත. එහෙත් එහි දළ බවක් පෙනේ. සිරස් පතයක් ද නොමැත. එක් කනක් ද හරියාකාරව නිමකර නැත. පා යුගලය ආසනයක් මත පිහිටුවා නොමැත. පිහිටි ගලෙන් ඉදිරියට මතුකරනා විට සැරූ කපාටය එපරිද්දෙන්ම රළුවට දිස්වේ එය සුමුදු කර නොමැත.

සුගතානන්ද හිමියන් සවසන පරිදි පිළිමය නෙලා ඇති කළුගල් තලාව පාෂාන මිශ්‍ර බුරුල් ගලකි. ඒ නිසා ස්වාභාවික විපත් වලින් බේරීමට පිළිමයට උඩින් පුරගෙයක් – පුරාතනයේ තිබී ඇත. දැවයෙන් කළ සිරස් පතක් ද පිළිමයේ තිබී ඇත. කාලිංග මාඝ මේ බිම ආක්‍රමණය කිරීමේදී රැස් වෙහෙර පිළිම වහන්සේට ද ආපදා ඇති කර පුරගෙය කඩා විනාශ කර සිරස සැරසූ සිරස් පතය ද කඩා දමා ඇත. පිළිම වහන්සේ සමීපයේ ගල් කණු ආදිය විසිරී ඇති සැටි අදත් දැක ගත හැක. පා යුගලයේ ඇඟිලි තුඩුද කැඩී ගොසිනි. එසේ මොන විපත් වුවත් අඩු ලුහුඬුකම් ඇතත් එය නිම කළ ගල් වඩුවාගේ නිර්මාණ ශක්තිය කිසිසේත්ම අවතක්සේරු කළ නොහැක. පිළිම වහන්සේ පිහිටි පසුබිම – එහි දැවැන්ත බව – පරිසරය – අපූරු නිර්මාණ ශක්තිය ආස්වාදනීය සිතකට කිසිඳු පළුද්දක් එක් නොකරන බවනම් සැබෑවකි.



රැස් වෙහෙර ඓතිහාසික පිළිම වහන්සේ

මෙම පිළිම වහන්සේ නිර්මාණය කරන ලද්දේ මහසෙන් රජ (ක්‍රි. ව 276 – 303) ගේ කාලයේ දී බව කියයි. මහසෙන් රජතුමා රශ්ශේර පර්වත පාදයේ රශ්ශේර පිළිමය කරවූ බව වංශ කතා වල සඳහන් වෙයි. එම රශ්ශේර පිළිමය රැස් වෙහෙර පිළිමය බව පරණවිතානයන්ගේ අදහසයි. පිළිමයේ අවසන් වැඩ කොටස නිමැවීමට පෙර මහසෙන් රජතුමා මියගියෙන් එහි වැඩ අවසන් කිරීමට නොහැකි වීම නිසා පිළිමයේ අඩු පාඩුකම් අදත් එලෙසම පවතී.

මෙම පුදබිමෙහි රෝපිතව ඇත්තේ ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ – දෙතිස් ඵල රුහ බෝධි අංකුරයක් බවත් එය රෝපණය කරන ලද්දේ දේවානම් පියතිස්ස රජතුමා විසින් බවත් (ක්‍රි. පූ 250 – 210) ජනප්‍රවාදයේ එන මතයකි.

බෝධීන් වහන්සේ රෝපණය කිරීමේදී පෙදෙස සිසාරා සවනක් රැස් විහිඳී පැතිරී ගිය බැවින් එද සිට මෙම පුදු බිම “රැස් වෙහෙර” ලෙස ව්‍යවහාර වූ බවක් කියැවේ. ක්‍රි. පූ. යුගයේ බ්‍රාහ්මී අක්ෂරයෙන් ලිවූ ලෙන් ලිපි අද ද මෙහි ඇති කඨාරම් කොටා ඇති ලෙන් මත තවමත් නොමැකී පවතී. එසේ නෙක දිසා සිසාරා විහිදි පැතිරී ඇති ලෙන් සංඛ්‍යාව 99 ක් පමණ වෙයි.

මෙසේ මහ රහතන් වහන්සේලා 364 නමක් මෙම පුද බිමෙහි වැඩ විසූ බව වංශ කතාවන්හි සඳහන්ව ඇති බව සුගතානන්ද හිමියෝ කියති.

වලගම්බා රජතුමා සොලී ආක්‍රමණයෙන් වසන් වී සැඟව හිඳ – පළමුවරට ඔහු විසින් සෑදූ ලෙන් විහාරය ඇත්තේ මේ පුද බිමේ බව උන්වහන්සේ තව දුරටත් පවසති.

එය “මහරජ විහාරය” නමින් අදත් දැක ගත හැක. පසුව ප්‍රතිසංස්කරණයන්ට බඳුන්ව ඇති චෛත්‍යය ද කරවන ලද්දේ වලගම්බා රජතුමා විසින් බව කියයි. මෙම විහාරස්ථානයට මහසෙන් රජතුමා විසින් ගව්ගනනාවක වපසරියක් සඟ සතු කර පූජා කළ බවක් ද කියැවේ. මෙහි නුවර යුග සම්ප්‍රදයේ ධර්ම ශාලාවක් ද පොහොය ගෙයක් ද ඇත.

වර්තමානයේ රැස් වෙහෙර රාජ මහා විහාරස්ථානයේ විහාරධිපතිත්වය දරන්නේ අස්ගිරි පාර්ශවයේ ජ්‍යෝෂ්ඨ කාරක සංඝ සභික වන්නි හත් පත්තුවේ ප්‍රධාන සංඝ නායක හුණුපොළගම වජිර ශ්‍රී නාහිමියන්ය.

දැනට අක්කර 400 ක පමණ භූමි භාගයකින් සමන් විත එදා මහරහතන් වහන්සේලාගේ පහසින් පූජනීය වූ බව සඳහන්, අලි ඇතුන් පවා සැරිසරන අඩවියක පිහිටි අපගේ උදර බොදු උරුමයක පැරැණි රහස් තවමත් සඟවාගෙන සිටිතැයි සිතිය හැකි, රැස් වෙහෙර රජ මහා විහාරය ඓතිහාසික සාඩම්බර උරුමයක් බව නම් සැබෑවක්මය.